# COMMUNICATION (Part-II)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# සන්නිවේදන මාධ්‍යයන්

- වාචික මාධ්‍යය
- ලිඛිත මාධ්‍යය
- සංඥා හා සංකේත මාධ්‍ය

# ව්‍යාපාර ආයතනයක සන්නිවේදනය සිදු වන ආකාරය

- අභ්‍යන්තර සන්නිවේදනය
- බාහිර සන්නිවේදනය

ClassWork.LK

# අභ්‍යන්තර සන්නිවේදනය

අභ්‍යන්තර සන්නිවේදනය යනු ව්‍යාපාර ආයතනය තුළ විවිධ පාර්ශ්ව අතර තොරතුරු හුවමාරු කර ගැනීමය.

අභ්‍යන්තර සන්නිවේදනයේ දී,

- අයිතිකරුවන් - කළමනාකරුවන් අතර
- සේවකයින් - සේවකයින් අතර
- දෙපාර්තමේන්තු - දෙපාර්තමේන්තු අතර විවිධ තොරතුරු හුවමාරු වීම සිදු වේ.

ClassWork.LK

# බාහිර සන්නිවේදනය

බාහිර සන්නිවේදනය යන්නෙන් අදහස් වන්නේ ව්‍යාපාර ආයතනයක් ව්‍යාපාර ආයතනයෙන් බාහිර පාර්ශ්ව හා ආයතන සමග තොරතුරු හුවමාරු කර ගැනීමයි.

බාහිර සන්නිවේදනයේ දී,

- ව්‍යාපාරය - ගනුදෙනුකරුවන් සමග
- ව්‍යාපාරය - වෙනත් ව්‍යාපාර, සැපයුම්කරුවන් අතර තොරතුරු හුවමාරු වීම සිදු වේ.

ClassWork LK

# විවිධ සන්නවේදන මාධ්‍යය මගින් සන්නිවේදනය සිදු කරන ආකාර

| | | | |
|---|---|---|---|
| වාචික මාධ්‍ය | අභ්‍යන්තර | විද්‍යුත් | ඉන්ටර්කොම් |
| | | විද්‍යුත් නොවන | සම්මුඛ සාකච්ඡා, සම්මන්ත්‍රණ, අභ්‍යන්තර රැස්වීම් |
| | බාහිර | විද්‍යුත් | දුරකථන, ජංගම දුරකථන, ශබ්ද විකාශ යන්ත්‍ර හඩ තැපැල |
| | | විද්‍යුත් නොවන | අඩබෙරය, මහජන රැස්වීම් |
| ලිඛිත මාධ්‍ය | අභ්‍යන්තර | විද්‍යුත් | විද්‍යුත් දැන්වීම් පුවරු, E-mail |
| | | විද්‍යුත් නොවන | මෙමෝ පත්‍ර, නිවේදන, දැන්වීම් පුවරු, වාර්තා |
| | බාහිර | විද්‍යුත් | Fax, E-mail ,විද්‍යුත් දැන්වීම් පුවරු, SMS සේවාව |
| | | විද්‍යුත් නොවන | ලිපිය, පුවත්පත්, සඟරා, බැනර්, පෝස්ටර්, ගැසට් පත්‍ර |
| සංඥා හා සංකේත | අභ්‍යන්තර | විද්‍යුත් | විදුලි සීනුව, අභ්‍යන්තර අනතුරු ඇඟවීමේ සංඥා |
| | | විද්‍යුත් නොවන | සීනුව, මග සලකුණු , ආයතනයේ පිහිටීම දක්වෙන සැලැස්ම, වම දකුණ හඳුනා ගැනීමේ පා සලකුණු |
| | බාහිර | විද්‍යුත් | අනතුරු හගවන නලා, විදුලි සංඥා (colour light ) ගිලන් රථ සංඥා |
| | | විද්‍යුත් නොවන | ඇසුරුම් සංකේත, දුම්රිය හා මහාමාර්ග සංඥා, බිහිරි අය සඳහා භාවිත වන සංඥා, ක්‍රීඩා විනිසුරුවාගේ තීරණ ලබා දීම, රථ වාහන හසුරවන්නන්ගේ අංග චලන |

Class Work.LK

## විද්‍යුත් සන්නිවේදනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධනය සමඟ බිහි වූ සන්නිවේදනය විද්‍යුත් සන්නිවේදනය වේ.

නවීන විද්‍යුත් සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වෙන අයුරින් පැහැදිලි කළ හැකි ය.

## අන්තර්ජාලය - (Internet)

පුළුල් පරාසයක් ආවරණය කරන පරිගණක ජාලයක් හෙවත් අන්තර්ජාතික වශයෙන් ඇති පරිගණක ජාලයකි. ජාලයන්ගේ ජාලය ලෙස ද අන්තර්ජාලය විස්තර කළ හැකි ය.
මෙහි දී විවිධ ස්ථානවලින් ඇතුළත් කෙරෙන තොරතුරු පෞද්ගලික පරිගණක ආශ්‍රයෙන් ලබා ගත හැකි ය.

## විද්‍යුත් තැපෑල - (E- Mail )

පරිගණකයකනි පරිගණකයකට අන්තර්ජාලය මගින් පණිවුඩ හුවමාරු කිරීම විද්‍යුත් තැපෑල ලෙස හඳුන්වයි. විද්‍යුත් ව සකසන ලද පණිවුඩය වෙනත් අයකුට යැවීමට නම් යවන්නාට හා ලබන්නාට අන්තර්ජාල පහසුකම් මෙන් ම E- Mail ලිපින ද තිබිය යුතු ය.

ClassWork.LK

# ඉන්ට්‍රානෙට් (Intranet)

අන්තර්ජාලය පදනම් කර ගනිමින් ව්‍යාපාර ආයතනය තුළ ඇති දත්තවලට ළගාවීමට සලසා ඇති ආයතනමය ජාලයකි. මෙය පුද්ගලයෙකු හෝ ආයතනයක පාලනය යටතේ පවතින ජාලයක් වන අතර මෙ මගින් සපයන සේවා අවසරලත් අයට පමණක් ලබා දිය හැකි ය.

# හඬ තැපෑල (Voice mail)

යවන්නා විසින් දුරකථන මාර්ගයෙන් වාචික ව දෙනු ලබන පණිවුඩය, ජාල මාර්ගයෙන් පරාවර්ථනය වී පසු ව ලබා ගැනීම පිණිස තැටියක ගබඩා කිරීමේ හෙවත් පටිගත කිරීමේ ක්‍රියා පද්ධතියකි.

# ෆැක්ස් යන්ත්‍ර (Fax)

සාමාන්‍ය දුරකථන පද්ධතියක් මගින් ලිපි හා චිත්‍ර අඩංගු ලියවිලි ක්ෂණික ව යැවීමට හැකියාව ඇති විද්‍යුත් උපකරණය ෆැක්ස් යන්ත්‍රය වේ. ෆැක්ස් ක්‍රමයේ දී පණිවුඩය යවනු ලබන ෆැක්ස් යන්ත්‍රය මගින් අදාළ ලියවිලිවල ඡායා පිටපත් ඩිජිටල් තාක්ෂණය මගින් ලබා ගෙන ඒවා ලබා ගන්නා ෆැක්ස් යන්ත්‍රය වෙත පරිවර්තනය කරයි.

ClassWork.LK

## ජංගම දුරකථන (Mobile phones)

වර්තමානයේ සන්නිවේදන තාක්ෂණයේ දියුණුව නිසා චන්ද්‍රිකා තාක්ෂණය ඇසුරෙන් විවිධ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා ජංගම දුරකථන උපයෝගී කර ගැනේ.

## ඉන්ටර්කොම් - (Intercom)

දුරකථන ජාලයක් ආශ්‍රයෙන් ආයතනය තුළ තොරතුරු හුවමාරු කර ගැනීමට පෞද්ගලික වශයෙන් ස්ථාපනය කර ගනු ලබන දුරකථන ජාලයකි.

ClassWork.LK

# සඵලදායී සන්නිවේදනයට ඇති බාධා

- නව තාක්ෂණ ක්‍රම භාවිතය පිළිබඳ ඇති දැනුම දුර්වල වීම
- සන්නිවේදන උපකරණ භාවිතයේ දී සිදු වන බාහිර බාධා
- පැරණි සන්නිවේදන ක්‍රම භාවිතයට ගැනීම
- සන්නිවේදන ගලායාමේ මාර්ගයේ දී ඇති වන බාධා
- සන්නිවේදන සැලසුම්වල ඇති දුර්වලතා
- භාෂා ප්‍රශ්න, දැනුම, ආකල්ප වැනි දෑ
- බාහිර පරිසරයේ ඇති වන බාධා

ClassWork.LK

# සන්නිවේදනයට ඇති වන බාධා පිටු දැකීමට ගත හැකි විවිධ ක්‍රම උපායන්

- නව සන්නිවේදන උපකරණ භාවිත කිරීම
- සන්නිවේදනය පිළිබඳ විවිධ නීති රීති පැනවීම
- සන්නිවේදන කුළුණු පිහිටුවීමේ කටයුතු ව්‍යාප්ත කිරීම
- ඩිජිටල් තාක්ෂණය භාවිත කිරීම
- සන්නිවේදන ක්‍රම අවභාවිතය පිළිබඳ නව නීති රීති සම්පාදනය කිරීම

ClassWork.LK

# විවිධ සන්නිවේදන මාධ්‍යවල වාසි හා අවාසි

## වාචික සන්නිවේදන මාධ්‍යයේ වාසි :

- ගැටලුවක් වඩාත් විස්තරාත්මක ව ඉදිරිපත් කොට, සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම
- තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම
- තොරතුරු ඉතා ඉක්මණින් හා රහසිගත ව ඉදිරිපත් කළ හැකි වීම

## වාචික සන්නිවේදන මාධ්‍යයේ අවාසි :

- භාෂාමය ගැටලු ඇති වීම
- වාචිකමය දුර්වලතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම
- තොරතුරු සන්නිවේදනය කළ බවට සාක්ෂියක් නො මැති වීම

ClassWork.LK

## ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ වාසි :

- වඩාත් විස්තරාත්මක ව තොරතුරු ඉදිරිපත් කළ හැකි වීම

- තොරතුරු සන්නිවේදනය කළ බවටත්, ලැබුණු බවටත් සාක්ෂියක් ලෙස භාවිත කළ හැකි වීම

- දත්ත, සටහන්, වගු යනාදිය පහසුවෙන් සන්නිවේදනය කළ හැකි වීම

## ලිඛිත සන්නිවේදන මාධ්‍යයේ අවාසි :

- තොරතුරු අවබෝධ කර ගැනීමේ දී ගැටලු ඇති වීම

- කියවීමේ හැකියාව නො මැති නම් තොරතුරු සන්නිවේදනය කිරීම අපහසු වීම

- තොරතුරු සන්නිවේදනය කිරීමේ දී විකෘති වීම

ClassWork.LK

## සංඥා හා සංකේත මාධ්‍යයේ වාසි :

- තොරතුරු කෙටියෙන් පැහැදිලි ව ඉදිරිපත් කළ හැකි වීම

- තොරතුරුවල නිරවද්‍යතාව ඉහළ මට්ටමක පැවතීම

- තොරතුරු පහසුවෙන් අවබෝධ කර ගත හැකි වීම

## සංඥා හා සංකේත මාධ්‍යයේ අවාසි :

- දෘෂ්ඨි ගැටලු හා ඌණතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම

- සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇති වීම

- සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසු වීම

- සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට ඒවා පිළිබඳ පෙර දැනුම අවශ්‍ය වීම

ClassWork.LK

2021
2022
2023

# උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

# සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## තනි හෝ කණ්ඩායම් පන්ති

## (English & Sinhala Medium)

# 0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura